# දකුණු පළාත් සභාව

# දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

# ලංසු කැඳවීමයි

# දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට ආහාර සැපයීමේ සේවාව පවත්වාගෙන යාම-2027

## SP/CS/NCB/2026/05

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙනුවෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට ආහාර සැපයීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

01.ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු කැඳවීම හරහා සිදු කෙරේ.

02.උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) විමසීම මඟින් හා procurementplan1@gmail.com විද්‍යුත් ලිපිනය මඟින් වැඩිමනක් තොරතුරු ලබා ගෙන පහත සඳහන් ලිපිනයේදී 2026 නොවැම්බර් 23 වැනිදා තෙක් සතියේ වැඩකරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැකිය.

ප්‍රසම්පාදන කළමනාකරණ අංශය,
ප්‍රධාන ලේකම් කාර්යාලය- දකුණු පළාත,
එස්.එච්.දහනායක මාවත,
ගාල්ල.

03. වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ පවත්වන පුහුණු වැඩසටහන් හා වෙනත් සාකච්ඡා සම්මන්ත්‍රණවලට සහභාගිවන මහජන නියෝජිතයින්, රාජ්‍ය නිලධාරීන් හා පුද්ගලික අංශයේ කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය ආහාර සැපයීමට මෙම කොන්ත්‍රාත්තුව මගින් අපේක්ෂා කරන බැවින් එම ඇණවුම් කරන ආහාරපාන නියමිත වට්ටෝරු අනුව සෞඛ්‍ය සම්පන්න ලෙස හා ප්‍රණීතව නියමිත වේලාවට සැපයීමට හැකියාව, පලපුරුද්ද හා සුදුසුකම් ඇති ආයතනයක් තෝරා ගැනීමට මෙම ලංසු කැඳවීම මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව ලංසු ඉදිරිපත් කිරීමේ දී පහත දැක්වෙන සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි ඒ සමග ඉදිරිපත් කළ යුතුය. ලංසුකරු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත් ගිවිසුම් අත්සන් කිරීමට පෙර එම සහතිකවල මුල් පිටපත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3.1 ව්‍යාපාර නාම ලියාපදිංචිය. (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය/ සමාගම් සංස්ථාගත කිරීමේ සහතිකය)

3.2 ආහාර සැපයීම් කටයුතු සම්බන්ධව අවම වශයෙන් වසර 05ක පලපුරුද්ද. (පලපුරුද්ද පිලිබඳ සහතික)

3.3 අදාළ කාර්යය ඉටු කිරීමට ඇති මූල්‍යමය හැකියාව. (පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශන/ අයිරා පහසුකම් ලබා ගැනීමේ හැකියාව සනාථ කරන ලියවිලි)

3.4 ආහාර සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා සකස් කරන ලද ආහාර සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවාහනය කිරීමට යොදාගත හැකි වාහන. (වාහන බලපත්‍රවල ඡායා පිටපත්)

3.5 සුදුසුකම් හා පලපුරුදු සහිත සේවකයන්. (අරක්කැමි හා ආහාර පිළිගන්වන සේවකයින් ගේ සුදුසුකම් හා පලපුරුද්ද ඇතුළත් ජීව දත්ත)

3.6 වෙනත් අමතර පහසුකම්. (බේකරි , ආපනශාලා පවත්වා ගෙන යාමට අදාළ සහතික)

3.7 සම්පූර්ණ කරනු ලැබූ හා දැනට ඉටු කරනු ලබන ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තු (නාම ලේඛනය)

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙතින් 2026 නොවැම්බර් 23 වැනිදා තෙක් සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සිංහල භාෂාවෙන් සකසන ලද ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක් ආපසු නොගෙවන රු.4,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් පසු මිලදි ගත හැකිය.

05.ලංසු ඉදිරිපත් කිරීමේදි රු.345,000 ක් වටිනා 2027.03.10 දින දක්වා වලංගු ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ඕනෑම වාණිජ බැංකුවකින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබා ගත් ලංසු සුරක්ෂණයක් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබා ගත් මුදල් කුවිතාන්සිය ලංසු පත්‍රිකාව සමඟ ඉදිරිපත්කළ යුතුය.

06. මෙම ප්‍රසම්පාදනට අදාළ පුර්ව ලංසු සාකච්ඡාවක් **2026.11.13 දින ප.ව 02.30** ට ගාල්ල එස්.එච්.දහනායක මාවතේ පිහිටි ප්‍රධාන ලේකම් කාර්යාලයේදි පවත්වනු ලැබේ. එදින භෞතිකව සම්බන්ධ විය නොහැකි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සහභාගිවීමට හැකියාව සලසනු ලැබේ.

07 .මුල් ලංසුව සහ එහි පිටපත වෙන වෙනම මුද්‍රා තබන ලද කවර තුල බහා එම මුද්‍රා තබන ලද කවර නැවත එක් කවරයක බහා මුද්‍රා තබා **2026 නොවැම්බර් 25 දින ප.ව 02.30** හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් රැගෙනවිත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කළමණාකරණ අංශයේ තබා ඇති ලේඛණයේ සටහන් කර ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. **''දකුණු පළාත් කළමණාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට ආහාර සැපයීමේ සේවාව පවත්වාගෙන යාම -2027 (SP/CS/NCB/2026/05)**'' යනුවෙන් ලංසු ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහල කෙළවරේ සඳහන් කළ යුතුය.

සභාපති,
ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
එස්.එච්.දහනායක මාවත,
ගාල්ල.
දුරකථන අංකය : 091-4944016/ 091-4946368
ඊ මේල් : procurementplan1@gmail.com
දිනය : 2026.11.04